භාසති වා කරොති වා
තතොනං දුක්ඛ මන්වේති
චක්කංව වහතො පදං"
යන්නත් එහි දෙවැන්න වන
"මනෝපුබ්බංගමා ධම්මා
මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නේන
භාසති වා කරොති වා
තතොනං සුඛ මන්වේති
ඡායාව අනපායිනී"

යන්නත් ශ්‍රාවකයන්ට සිහිපත් කරවමින් උක්ත ගීතයෙහි පද ගැළපීම කර ඇති අයුරු පෙනේ. දුෂ්ට සිතින් කරන කියන දේ, 'ගැල අදින ගවයාගේ පාදය අනුව කරත්ත රෝදය ඇදී යන්නාක් මෙන්' අයහපත් ප්‍රතිඵල ලබා දෙන අතර, හොඳ චේතනාවෙන් කරනු ලබන දේවල යහපත් ප්‍රතිඵල 'පුද්ගලයාගේ සෙවණැල්ල මෙන්' එම පුද්ගලයා පසුපසින්, ඒ සමගම ගමන් කරන බව සිද්ධාර්ථ හිමියන්ගේ ගීතයෙන් ද බෞද්ධ ශ්‍රාවකයන්ගේ මතකයට නංවන අයුරු පැහැදිලිය.

"පිපෙනා මලකට
ගලනා දොළකට
දැනෙනා බුදුගුණ
නොදැනෙන මිනිසුනි"

එවන් අඥාන මෙන්ම පාපී සිත් ඇත්තවුන්ට මරණින් මතු කුමක් සිදු වේද යන්න මෙම ගී පද සංයෝජනයෙන් මොනවට පැහැදිලි කෙරෙයි.

තවද බුදුගුණ යනු ලොව මිනිසුන්ට, සතුන්ට පමණක් නොව පිපෙනා මලක්, ගලන දොළක් වැනි අප්‍රාණික දේට පවා දැනෙන යහපත් වූ ගුණ සමුදායකි. එපමණකුදු නොව දක්ෂ නිර්මාණ කරුවන් මහඟු බුදුරුව ගලකින්, මැටි පිඩකින් නිමවන්නට සමත් වන අතර එවැනි අජීවී ද්‍රව්‍යයන්ට පවා ඉමිහිරි බුදුගුණ දැනී යද්දී පින් පව් නොදන්නා මිනිසුන්ට පමණක් එය නොදැනීමේ අයහපත් තත්වය මෙම ගී පදවලින් ගළපා ඉදිරිපත් කරද්දී රසික මනස තුළ බුද්ධාලම්බන ප්‍රීතිය, ශ්‍රද්ධාව දනවනසුලුය.

එමතු නොව ඉරට, හඳට, මහ පොළවට යනාදී වශයෙන් මේ විශ්වයේ ඇති හැම වස්තුවකටම හොඳින් දැනෙන එම අමාදහම මේ පව්කාර සත්වයන්ට නොදැනෙන්නේ ඇයිද යන්න ගීත රචක හිමියන් රචනා කර ඇත්තේ ද සංවේදී හැඟීම්වලින් යුතුවයි. එමෙන්ම එවන් සංවේදී හැඟීම් සහෘද මනස තුළ ද දනවමිනි.

මෙම ගීත රචනයෙන් සිද්ධාර්ථ හිමියන් පවසා ඇත්තේ ඉතා සරල අදහසකි. එසේ වුවද පද යෝජනයෙන් එහි ගීතමය බව මෙන්ම නිර්මාණශීලී ගුණය ද වර්ධනය කරගෙන ඇත. මෙම ගීතයෙහි මනා පද ගැළපීමෙන් සිද්ධාර්ථ හිමියන් ඊට නිසි සාධාරණත්වය ඉටු කළාක් මෙන්ම විශිෂ්ට සංගීතඥ ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහතා සංගීත නිර්මාණයෙන් ද විශාරද මාලිනී බුලත්සිංහල ගායිකාව සිය මිහිරි ගායනයෙන් ද මෙම ගීතයෙහි වටිනාකම දෙගුණ තෙගුණ කර ඇති බව කිව යුතුය.

පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේගේ මනසෙහි පහළ වුණ තවත් මනහර ගී සංකල්පනාවක් පහත දැක්වෙන ගීතයෙන් ප්‍රතීයමාන වෙයි.
"සාදු කියන්නට
මල් වට්ටියකට
තෙල් මල් අරගෙන පෙර කාලේ
ආවා මිනිසුන්
පෝයට පන්සල්
ගම රට යහපත් ඒ කාලේ
අසමින් බුදුබණ
උන්නා බිම හිඳ
විඳිමින් බණ රස ඒ කාලේ
කියමින් බුදුබණ
වැන්දා වෙහෙරට
නිවමින් හිත දුක සංසාරේ
එදා සාදු හඬ
මෙදා නැතේ ගම
දියුණුව ඒකද අද කාලේ
මේවා දැක දැක
කම්පා වෙන්නට
උන්නා නොවැ අපි මේ කාලේ"

පද රචනය :රඹුකන සිද්ධාර්ථ හිමි
සංගීතය : ප්‍රේමසිරි කේමදාස
ගායනය : විශාරද එඩ්වඩ් ජයකොඩි

අතීත කාමය (නොස්ටැල්ජියා) යන යෙදුම බොහෝ විට අප කාහට වුවද, පෙර තිබූ දේ සිහිපත් වීමෙන් දැනෙන වේදනාවකි. එහෙත් එය සැමවිටම සාධාරණ හෝ යහපත් නොවන්නේය. එසේ වුවද බුදු දහම එදා සමාජයේ ප්‍රචලිතව පැවති අන්දම, බෞද්ධයන් ඊට ගරු කළ අන්දම, ඒ අනුව යහපත් ජීවිත ගත කළ අන්දම ගැන සිතා අද සමාජය තුළ සිදු වී ඇති අයහපත් තත්වයන් ගැන මනසින් කම්පා වීම, එම 'අතීත කාමය' යන සංකල්පයම නොවේ. ගී පද රචක රඹුකන සිද්ධාර්ථ හිමි ගෞරවනීය බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් ලෙසින්, බුදු දහම පවත්නා අපේ සමාජය තුළ එදා සහ අද වෙනස ගැන දකිමින් සිත් වේදනාවට පත් වීම සාධාරණ ස්වභාවයකි. ඒ අනුව සිද්ධාර්ථ හිමියන්ගේ සිත් තුළ ජනිත වූ එම සංවේදී හැඟීම් සමුදාය ගීතමය අගයක් මෙන්ම සරල බවක් ද මතු වන සේ මෙලෙසින් රචනා කර තිබීම රසික අපට ද අගනා අත්දැකීමක් ගෙන

## බෝසත් ගතිගුණ පිහිටන්නේ නැති ගතියක්
## අපහට ඇතිවද මන්දා
## මේ තරමට බුදුබණ අහනා රට
## දින දින පිරිහෙන කරුමය මන්දා

එයි.

සිද්ධාර්ථ හිමියන් මෙලෙසින් සිය කුසලතාව, එනම් ගීත රචනයෙහි ඇති ප්‍රතිභාව, දහම් දෙසන්නට ද යෝග්‍ය වන සේ ගළපාගෙන තිබීම විශිෂ්ට ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකිය. ගද්‍ය මාධ්‍යයෙන් ධර්ම දේශනා කළ හැකි වන්නා සේම, කවියෙන් ද බණ කීම කළ හැකි බව වර්තමානයේ ඇතැම් භික්ෂූන් වහන්සේලා ඔප්පු කර ඇත. රඹුකන සිද්ධාර්ථ හිමිපාණන් ඇතුළු තවත් සංඝයා වහන්සේ කිහිප නමක්ම ගීතයෙන් බුදුබණ කීම, එපමණක් නොව, කලාත්මක ලෙස, නිර්මාණාත්මක ලෙස එසේ කළ හැකි බව සනාථ කර තිබෙන බවට උක්ත ගී පද රචනා දෙක ඇතුළු අනිකුත් භික්ෂූන් වහන්සේලාගේ ඇතැම් නිර්මාණ ද සාක්ෂි දරයි.

රඹුකන සිද්ධාර්ථ හිමියන් තමන් වහන්සේගේ ගී පදවලින් මතු කරලන අරුත්බර හැඟීම් සැබවින්ම මනා සංයමයකින් යුතුව ඉදිරිපත් කර තිබීම විශේෂත්වයකි. උන්වහන්සේ අතින් ලියවුණ තවත් ගීත ඛණ්ඩයක් ද මෙහිලා බෙහෙවින් යෝග්‍ය වනු ඇත. බෞද්ධ අප තුළ ඒකායන වශයෙන් බෝසත් ගු-ණ පිහිටිය යු-තු යයි සිතන සිද්ධාර්ථ හිමියන්, නූතන සමාජය අහිමි කොටගෙන ඇති එම ස්වභාවය ගැන ද මතු දැක්වෙන යෙදුම්වලින් පැහැදිලි වෙයි.

"බෝසත් ගතිගුණ පිහිටන්නේ නැති
ගතියක් අපහට ඇතිවද මන්දා
මේ තරමට බුදුබණ අහනා රට
දින දින පිරිහෙන කරුමය මන්දා"

සිද්ධාර්ථ හිමියන්ගේ මෙම කම්පා වීම උන්වහන්සේගේ නිර්මාණ ඔස්සේ බෞද්ධ රසිකයාට දෙන යහපත් පණිවුඩයක් ද වනු නොඅනුමානය.





